24761

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ආර්ථික විද්‍යාව II
பொருளியல் II
Economics II

21 S II

2019.08.06 / 1300 - 1610

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස් :**

* 'අ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, 'ආ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* ප්‍රස්තාර කඩදාසි සපයනු ලැබේ.

## 'අ' උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරාගන්න.)

**1.** (i) පහත සඳහන් එක් එක් දෑ අයත් වන්නේ කවර නිෂ්පාදන සම්පත් ගණයකට ද?

(අ) සේවා වියුක්ත ශ්‍රමිකයෙක්

(ආ) ලක්විජය ගල් අඟුරු බලාගාරය

(ඉ) නුවරඑළියේ පිහිටි තේ වත්තක්

(ඊ) සිංහරාජ වනාන්තරය (ලකුණු 04යි)

(ii) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය පදනම් කරගන්නා උපකල්පන කවරේ ද? (ලකුණු 04යි)

(iii) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක වැඩෙන ආවස්ථික පිරිවැය නිරූපණය වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. ආවස්ථික පිරිවැය ස්ථාවර අගයක් ගන්නා විට වක්‍රය කෙබඳු හැඩයක් ගන්නේ ද? ඔබේ පිළිතුරු රූපසටහන් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iv) ආර්ථික පද්ධති වර්ගීකරණය සඳහා යොදාගනු ලබන නිර්ණායක කවරේ ද? (ලකුණු 04යි)

(v) සම්පත් බෙදී යාමේ ආර්ථික කාර්යක්ෂමතාව සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය කරන කොන්දේසි සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

**2.** තරගකාරී වෙළෙඳපොළක අලෙවි කෙරෙන භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත සඳහන් සමීකරණ මගින් නිරූපණය කෙරේ.

ඉල්ලුම් සමීකරණය : $Q_D = 100 - 2P$ සැපයුම් සමීකරණය : $Q_S = -30 + 3P$

(i) මෙම භාණ්ඩයේ සමතුලිත මිල සහ ප්‍රමාණය සොයන්න. (ලකුණු 04යි)

(ii) වෙළෙඳපොළ සමතුලිතයේ දී මිල ඉල්ලුම් නම්‍යතාව ගණනය කරන්න. (ලකුණු 04යි)

(iii) දැන් මෙම භාණ්ඩයේ නිෂ්පාදකයන් වෙත ඒකකයකට රුපියල් 5 බැගින් වන සහනාධාරයක් ලබා දීමට රජය තීරණය කොට තිබේ යැයි සිතන්න. සහනාධාරය ලබා දුන් පසු මෙම භාණ්ඩයේ වෙළෙඳපොළ සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 04යි)

(iv) සහනාධාරයට පෙර සහ සහනාධාරයට පසු ආර්ථික අතිරික්තය සංසන්දනය කරන්න. (ලකුණු 04යි)

(v) සහනාධාරය හඳුන්වා දුන් පසුව මෙම වෙළෙඳපොළෙහි සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව ගැන ඔබට නිගමනය කළ හැක්කේ කුමක් ද? (ලකුණු 04යි)

[දෙවැනි පිටුව බලන්න

Department of Examinations Sri Lanka

**3.** (i) හීනවන ආන්තික ඵල සහ අඩු වන පරිමාණානුකූල ඵල ආයතනයක නිෂ්පාදන පිරිවැය කෙරෙහි බලපාන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) පහත සඳහන් එක් එක් ද ආයතනයක කෙටි කාලීන ආන්තික පිරිවැය වක්‍රය සහ මුළු ස්ථාවර පිරිවැය වක්‍රය කෙරෙහි කවර බලපෑමක් කරනු ලැබේ ද?

(අ) වැටුප් අනුපාතිකයේ ඉහළ යාමක්

(ආ) දේපොළ බදු පහළ යාමක්

(ඉ) නව ප්‍රාග්ධන උපකරණවල ගැනුම් මිල ඉහළ යාමක්

(ඊ) බලශක්ති මිල ගණන් ඉහළ යාමක් (ලකුණු 04යි)

(iii) කිසියම් කර්මාන්තයක වෙළෙඳපොළ ව්‍යුහය නිර්ණය කිරීමේ දී සැලකිල්ලට ගනු ලබන සාධක කවරේ ද? (ලකුණු 04යි)

(iv) පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක් මුහුණ දෙනුයේ කවර ස්වරූපයක ඉල්ලුම් වක්‍රයකට ද? හේතු පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(v) පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක් කෙටි කාලයේ දී පහත සඳහන් එක් එක් තත්ත්වයනට මුහුණපෑමට පුළුවන. ඒ එක් එක් අවස්ථාවේ දී ආයතනය කෙටි කාලයේ දී නිෂ්පාදනයේ යෙදිය යුතු ද? නැතහොත් කෙටි කාලයේ දී වසා දැමිය යුතු ද? එසේත් නැතහොත් කෙටි කාලයේ දී ආයතනය කුමක් කළ යුතු ද යන්න තීරණය කිරීමට තවත් අතිරේක තොරතුරු අවශ්‍ය වේ ද? යන්න සඳහන් කරන්න.

(අ) සෑම නිමැවුම් මට්ටමක දී ම මුළු පිරිවැය මුළු අයභාරය ඉක්මවා යයි.

(ආ) සෑම නිමැවුම් මට්ටම්මක දී ම මුළු විචල්‍ය පිරිවැය මුළු අයභාරය ඉක්මවා යයි.

(ඉ) සෑම නිමැවුම් මට්ටමක දී ම මුළු අයභාරය මුළු ස්ථාවර පිරිවැය ඉක්මවා යයි.

(ඊ) සෑම නිමැවුම් මට්ටමක දී ම මිල සාමාන්‍ය මුළු පිරිවැය ඉක්මවා යයි. (ලකුණු 04යි)

**4.** (i) සත්‍ය වශයෙන්ම වියදම් සහ ආදායම් ප්‍රවේශ නිෂ්පාදනය මිනුම් නොකරන විටෙක, වියදම් ප්‍රවේශය හෝ ආදායම් ප්‍රවේශය හෝ යොදා ගනිමින් දළ දේශීය නිෂ්පාදිතය මිනුම් කළ හැකි වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) පරිලේඛන/තොග වෙනස්වීම් ආයෝජන වියදමේ සංරචකයක් ලෙස ඇතුළත් කරගනු ලබන්නේ ඇයි? (ලකුණු 04යි)

(iii) වියදම් ප්‍රවේශය ඔස්සේ දළ දේශීය නිෂ්පාදිතය මිනුම් කිරීමේ දී සැලකිල්ලට ගැනෙන ප්‍රධාන වියදම් සංරචක කවරේ ද? (ලකුණු 04යි)

(iv) පහත සඳහන් එක් එක් ද නිර්වචනය කරන්න.

(අ) දළ ජාතික ආදායම

(ආ) වැය කළ හැකි දළ ජාතික ආදායම

(ඉ) පෞද්ගලික ආදායම

(ඊ) වැය කළ හැකි පෞද්ගලික ආදායම (ලකුණු 04යි)

(v) "ආර්ථික අවබෝධය හා විශ්ලේෂණය සඳහා ජාතික ගිණුම් දත්ත ඉතා ප්‍රබල උපකරණයක් වේ." පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

**5.** (i) ආන්තික පරිභෝජන නැඹියාව (MPC) යනුවෙන් කවරක් අදහස් කෙරේ ද? එය එකට වඩා අඩු අගයක් ගනුයේ ඇයි? (ලකුණු 04යි)

(ii) ගුණකයේ අගය ආන්තික පරිභෝජන නැඹියාවේ අගය සමග අනුලෝම වශයෙන් සම්බන්ධ වී ඇත්තේ ඇයි? (ලකුණු 04යි)

(iii) කිසියම් කල්පිත ආර්ථිකයක සමාහාර පරිභෝජන වියදම පහත සමීකරණයෙන් පෙන්නුම් කෙරේ.

$$C = 50 + 0.75Y_D$$

තව ද සෑම ආදායම් මට්ටමක දී ම ආයෝජන වියදම රුපියල් බිලියන 700ක් බවත්, ශුද්ධ අපනයන ශුන්‍ය බවත් උපකල්පනය කරන්න. ආණ්ඩුවේ අය-වැය ලේඛනය තුලනය වන අතර ආණ්ඩුවේ මිල දී ගැනීම් සහ බදු රුපියල් බිලියන 500 බැගින් වේ.

(අ) දළ දේශීය නිෂ්පාදිතයේ සමතුලිත මට්ටම ගණනය කරන්න. (ලකුණු 02යි)

(ආ) විභව දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන 5 000ක් වේ නම්, ආර්ථිකයේ අවධමනාත්මක හෝ උද්ධමනාත්මක හෝ පරතරයක් පවතී ද? එසේ නම් එය කොපමණ ද? (ලකුණු 02යි)

[තුන්වැනි පිටුව බලන්න

Department of Examinations Sri Lanka

24761

AL/2019/21/S-I(OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ආර්ථික විද්‍යාව I
பொருளியல் I
Economics I

21 S I

2019.08.05 / 1300 - 1500

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 01 | 01 - 04 | |
| 02 | 05 - 12 | |
| 03 | 13 - 19 | |
| 04 | 20 - 24 | |
| 05 | 25 - 32 | |
| 06 | 33 - 37 | |
| 07 | 38 - 43 | |
| 08 | 44 - 50 | |
| එකතුව | | |

විභාග අංකය : ..............................

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි

| | අත්සන | සංකේත අංක |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

**උපදෙස්:**

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.

※ **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.

※ අංක **1** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා **එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**

**1.** ආර්ථික විද්‍යාවේ කේන්ද්‍රීය ගැටලුව වන්නේ
(1) පොදු භාණ්ඩ හා සේවා සැපයීම උදෙසා ප්‍රජාතාන්ත්‍රීය දේශපාලන රාමුවක් ස්ථාපිත කිරීම ය.
(2) භාණ්ඩ හා සම්පත්වල සාපේක්ෂ හිඟකම නිවැරදිව නිරූපණය වන ආකාරයට මිල ගණන් සකසා ගැනීම ය.
(3) මිනිස් වුවමනාවන්ට සාපේක්ෂව ඵලදායී සම්පත්වල හිඟකම ය.
(4) දිළිඳුකම අඩුකරලීම සඳහා මුදල් ආදායමේ වඩාත් සම ව්‍යාප්තියක් අත්කර ගැනීම ය.
(5) තිරසාර සංවර්ධනය අත්කර ගැනීම ය. (......)

**2.** මානව ප්‍රාග්ධනය යනු
(1) සංස්ථා සහ රජය හැර පුද්ගලයන් සතු සියලු ම ප්‍රාග්ධනයයි.
(2) රජය හැර පුද්ගලයන් සහ සංස්ථා සතු සියලු ම ප්‍රාග්ධනයයි.
(3) මිනිසුන්ගේ පරිහරණයට ගැළපෙන ආරක්ෂක ප්‍රමිති සපුරා ඇති යන්ත්‍ර සූත්‍රයි.
(4) ශ්‍රම හමුදාව සතු කුසලතා සහ දැනුම් සම්භාරයයි.
(5) පාසල් සහ රෝහල් සඳහා යටිතල පහසුකම් ඉදිකිරීමයි. (......)

**3.** නිෂ්පාදන කාර්යක්ෂමතාව යන්නෙන් අදහස් කරනුයේ
(1) අඩුම පිරිවැයක් ගෙනදෙන නිෂ්පාදන ශිල්ප ක්‍රම භාවිත කිරීම ය.
(2) සමාජයට වඩාත් වුවමනා කරන භාණ්ඩ මිශ්‍රණය නිෂ්පාදනය කිරීම ය.
(3) පවත්නා සියලු ම සම්පත් පූර්ණ සේවා නියුක්ත වීම ය.
(4) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය ඇතුළත කිසියම් ලක්ෂ්‍යයක නිෂ්පාදනය කිරීම ය.
(5) ශ්‍රමය වෙනුවට ප්‍රාග්ධනය ආදේශ කරන තාක්ෂණික දියුණුවකි. (......)

**4.** ඵලදායී සම්පත්වල හිඟකමක් ඇති බැවින්, කිසියම් භාණ්ඩයක් වැඩියෙන් නිපදවා ගැනීමට, තවත් භාණ්ඩයක නිෂ්පාදනය කිසියම් ප්‍රමාණයකින් කැප කළ යුතු ය. මෙම ලක්ෂණය අන්තර්ගත සංකල්පය වනුයේ
(1) විශේෂ ප්‍රාගුණ්‍යනයයි. (2) ආරෝපිත පිරිවැයයි.
(3) සාපේක්ෂ වාසියයි. (4) නිරපේක්ෂ වාසියයි.
(5) ආවස්ථික පිරිවැයයි. (......)

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**5.** නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් මගින් ආර්ථික වෘද්ධිය පෙන්නුම් කළ හැක්කේ පහත සඳහන් කවර ආකාරයකට ද?
(1) වක්‍රය දකුණට විතැන් කිරීමකින්
(2) පවත්නා වක්‍රය මත ම ඉහළට ගමන් කිරීමකින්
(3) පවත්නා වක්‍රය මත ම පහළට ගමන් කිරීමකින්
(4) වක්‍රයෙන් පිටත ලක්ෂ්‍යයක සිට වක්‍රය මත ලක්ෂ්‍යයක් කරා ගමන් කිරීමකින්
(5) වක්‍රය මත ලක්ෂ්‍යයක සිට වක්‍රය ඇතුළත ලක්ෂ්‍යයක් කරා ගමන් කිරීමකින් (......)

**6.** ආර්ථිකයේ කුමක් නිෂ්පාදනය කළ යුතු ද යන්න තම ඉල්ලුම මත පාරිභෝගිකයින් විසින් තීරණය කරනු ලැබේ ය යන අදහස හඳුන්වනුයේ
(1) රාජ්‍ය නිර්බාධ ආර්ථිකයක් ලෙස ය.
(2) වෙළෙඳපොළ ආර්ථිකයක් ලෙස ය.
(3) පාරිභෝගික ස්වාධිපත්‍යය ලෙස ය.
(4) නිදහස් ව්‍යවසාය ලෙස ය.
(5) මිශ්‍ර ආර්ථිකයක් ලෙස ය. (......)

**7.** සාමාන්‍ය භාණ්ඩයක මිල අඩුවීමක ආදේශන ප්‍රතිවිපාකය පිළිබඳව පහත සඳහන් කවරක් නිවැරදි වේ ද?
(1) එය ආදායම් ප්‍රතිවිපාකය කපා හැරීමට කටයුතු කරයි.
(2) එය ආදායම් ප්‍රතිවිපාකය ශක්තිමත් කිරීමට කටයුතු කරයි.
(3) එය ආදායම් ප්‍රතිවිපාකයට වඩා අඩු අගයක් ගනී.
(4) එය භාණ්ඩය ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අඩු කිරීමට හේතු වේ.
(5) එය භාණ්ඩය සඳහා ඉල්ලුම වැඩි කිරීමට හේතු වේ. (......)


**8.** කිසියම් භාණ්ඩයක සැපයුම් වක්‍රය දකුණට විතැන් කිරීමට පහත සඳහන් කවරක් හේතු වේ ද?
(1) නිෂ්පාදන පිරිවැයෙහි ඉහළ යාමක්
(2) නිෂ්පාදන පිරිවැයෙහි අඩු වීමක්
(3) මිලෙහි ඉහළ යාමක්
(4) මිලෙහි පහළ යාමක්
(5) ඉල්ලුම අඩු වීමක් (......)

**9.** කිසියම් භාණ්ඩ දෙකක් ආදේශක බව ඇඟැවෙන්නේ පහත සඳහන් කවරකින් ද?
(1) ආදායම් ඉල්ලුම් නම්‍යතාව ධන අගයක් ගැනීම
(2) හරස් මිල ඉල්ලුම් නම්‍යතාව ශුන්‍යයට වඩා අඩු අගයක් ගැනීම
(3) මිල ඉල්ලුම් නම්‍යතාව එකට වඩා අඩු වීම
(4) හරස් මිල ඉල්ලුම් නම්‍යතාව ධන අගයක් ගැනීම
(5) ඉල්ලුම් වක්‍රය තිරස් රේඛාවක් වීම (......)

**10.** වායුසමීකරණ යන්ත්‍ර නිෂ්පාදනය මත රජය විසින් බද්දක් පනවනු ලැබුවහොත් වායුසමීකරණ යන්ත්‍ර වෙළෙඳපොළෙහි පහත සඳහන් කවරක් සිදු වේ ද?
(1) සැපයුම් වක්‍රය මත දකුණට ගමන් කිරීමක් සිදුවනු ඇත.
(2) ඉල්ලුම් වක්‍රය මත දකුණට ගමන් කිරීමක් සිදුවනු ඇත.
(3) සැපයුම් වක්‍රය දකුණට විතැන් වනු ඇත.
(4) සැපයුම් වක්‍රය වමට විතැන් වනු ඇත.
(5) ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වනු ඇත. (......)

**11.** ආයතනයක් 20% කින් මිල ඉහළ නැංවීමේ ප්‍රතිඵලයක් ලෙස එහි අයභාරය 10% කින් වැඩි වේ නම්, මෙම මිල පරාසය තුළ ආයතනය මුහුණ දෙන ඉල්ලුම
(1) අනම්‍ය විය යුතු ය.
(2) නම්‍ය විය යුතු ය.
(3) ඒකීය නම්‍ය විය යුතු ය.
(4) පූර්ණ නම්‍ය විය යුතු ය.
(5) පූර්ණ අනම්‍ය විය යුතු ය. (......)

**12.** පහත රූපසටහන වෙළෙඳපොළ සැපයුම් වක්‍ර හතරක් නිරූපණය කරයි. එම සැපයුම් වක්‍රවල මිල නම්‍යතාව පිළිබඳ කවර ප්‍රකාශනයක් නිවැරදි වේ ද?
(1) මිල ඉහළ යත්ම $S_1S_1$ වක්‍රයෙහි නම්‍යතාව අඩු වෙමින් පවතී.
(2) මිල ඉහළ යත්ම $S_2S_2$ වක්‍රයෙහි නම්‍යතාව වැඩි වෙමින් පවතී.
(3) මිල ඉහළ යත්ම $S_3S_3$ වක්‍රයෙහි නම්‍යතාව අඩු වෙමින් පවතී.
(4) $S_4S_4$ වක්‍රයෙහි ස්ථාවර අපරිමිත නම්‍යතාවක් පවතී.
(5) $S_2S_2$ වක්‍රයෙහි එකට වඩා වැඩි නම්‍යතාවක් පවතී.





(......)



Department of Examinations Sri Lanka

**13.** අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩයක් සඳහා සහනාධාරයක් ලබා දීමට පෙර හා පසු වෙළෙඳපොළ තත්ත්වය පහත සඳහන් රූපසටහන පෙන්නුම් කරයි.




සහනාධාර වශයෙන් ගෙවන ලද මුළු මුදල් ප්‍රමාණය කුමක් ද?

(1) OKL$Q_2$ (2) OCS$Q_1$ (3) OAB$Q_2$ (4) ABEC (5) KABL (......)

**14.** X භාණ්ඩය තරගකාරී වෙළෙඳපොළක අලෙවි කෙරේ යැයි උපකල්පය කරන්න. X භාණ්ඩයේ නිෂ්පාදනය මත ඒකක බද්දක් පනවනු ලැබුවහොත් පහත සඳහන් කවරක් නිවැරදි වේ ද?
(1) ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය වේ නම්, බද්දේ ප්‍රමාණයෙන් මිල ඉහළ නොයයි.
(2) ඉල්ලුම් වක්‍රය පූර්ණ අනම්‍ය වේ නම්, බද්දේ ප්‍රමාණයෙන් මිල ඉහළ නොයයි.
(3) ඉල්ලුම් වක්‍රය වඩා නම්‍ය වන විට, පාරිභෝගිකයාගේ බදු බර ඉහළ නගී.
(4) ඉල්ලුම් වක්‍රයේ නම්‍යතාව අඩු වන විට, පාරිභෝගිකයාගේ බදු බර ඉහළ නගී.
(5) බද්දේ ප්‍රතිඵලයක් වශයෙන් පාරිභෝගික අතිරික්තය ඉහළ නගී. (......)

**15.** හීනවන ආන්තික ඵල හටගන්නා විට යෙදවුමක
(1) ආන්තික නිෂ්පාදිතය ඉහළ නගිමින් පවතී.
(2) ආන්තික නිෂ්පාදිතය ශුන්‍ය වේ.
(3) ආන්තික නිෂ්පාදිතය පහළ බසිමින් පවතී.
(4) මුළු නිෂ්පාදිතය ශුන්‍ය වේ.
(5) මුළු නිෂ්පාදිතය සෘණ අගයක් ගනී. (......)

**16.** කුඩා ආපනශාලාවක හිමිකරුවකුගේ ආරෝපිත පිරිවැයට පහත සඳහන් කවරක් ඇතුළත් වේ ද?
(1) සහාය කළමනාකරුට ගෙවන වැටුප
(2) තොග සැපයුම්කරුවකුගෙන් මස් මිල දී ගැනීමට දරන පිරිවැය
(3) ජල සම්පාදන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය සඳහා දරන පිරිවැය
(4) හිමිකරුවාගේ කුසලතා විකල්ප රැකියාවක යෙදවූයේ නම් එයට හිමිවන වටිනාකම
(5) ප්‍රාදේශීය පරිපාලන අධිකාරීන් වෙත ගෙවන ලද දේපොළ බදු සඳහා දැරූ පිරිවැය (......)

**17.** කෙටි කාලය තුළ කටයුතු කරන පූර්ණ තරගකාරී ආයතනයක් පිළිබඳව පහත සඳහන් කවරක් නිවැරදි වේ ද?
(1) ආයතනය සැම විට ම ප්‍රාමාණික ලාභ උපයයි.
(2) මිල සාමාන්‍ය මුළු පිරිවැයට වඩා පහළ වැටුණහොත් ආයතනය වසා දමයි.
(3) ආයතනය සැම විට ම ධන ආර්ථික ලාභ උපයයි.
(4) මිල ආන්තික අයභාරයට සමාන වන තැන නිෂ්පාදනයෙහි යෙදෙමින් ආයතනය ලාභ උපරිම කරයි.
(5) ආයතනය ධන ලාභ හෝ සෘණ ලාභ හෝ ප්‍රාමාණික ලාභ හෝ ඉපැයීමට පිළිවන. (......)

**18.** පූර්ණ තරගකාරී වෙළෙඳපොළ ව්‍යුහයක ලක්ෂණයක් වන්නේ පහත සඳහන් කවරක් ද?
(1) ආයතන සමජාතීය භාණ්ඩයක් නිෂ්පාදනය කරයි.
(2) ප්‍රවේශයට බාධා පවතී.
(3) ආයතන මිල සකසමින් ලාභ උපරිම කරයි.
(4) කෙටි කාලයේ දී සැම විට ම ප්‍රාමාණික ලාභ උපයයි.
(5) අභිමිවන ශුභසාධනය දුරලීම් වස් රජය මිල ගණන් නියාමනය කරයි. (......)

**19.** ආයතනයක් පූර්ණ තරගකාරී වෙළෙඳපොළක කටයුතු කරන්නේ යැයි සලකන්න. එම ආයතනය තම නිමැවුම 5% කින් වැඩි කරයි නම්, ආයතනයේ මුළු අයභාරය මත කවර බලපෑමක් සිදු වේ ද?
(1) මුළු අයභාරය නොවෙනස් වනු ඇත.
(2) මුළු අයභාරය 5% කින් ඉහළ යනු ඇත.
(3) මුළු අයභාරය 5% කට වඩා අඩු ප්‍රමාණයකින් ඉහළ යනු ඇත.
(4) මුළු අයභාරය 5% කට වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ යනු ඇත.
(5) මුළු අයභාරය ශුන්‍ය වනු ඇත. (......)



Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

**20.** රාජ්‍ය අංශය සහ ජාත්‍යන්තර වෙළෙඳාම නොමැති ආර්ථිකයකට අදාළ චක්‍රීය ප්‍රවාහ ආකෘතියෙහි, කුටුම්බ
(1) අවසාන භාණ්ඩ මිල දී ගන්නා ගැනුම්කරුවන්ගෙන් ආදායම් ලබයි.
(2) භාණ්ඩ වෙළෙඳපොළෙහි සම්පත් අලෙවි කිරීමෙන් ආදායම් ලබයි.
(3) ව්‍යාපාරික ආයතන සතු සම්පත් භාවිත කිරීම වෙනුවෙන් එම ආයතනවලට ගෙවීම් කරයි.
(4) තම නිෂ්පාදන සාධක භාවිතයට ගැනීම වෙනුවෙන් නිෂ්පාදකයන්ගෙන් ආදායම් ලබයි.
(5) තම ඉතුරුම් භාවිතයට ගැනීම වෙනුවෙන් නිෂ්පාදකයන් වෙත ආදායම් ගෙවීම් කරයි. (……)

**21.** කිසියම් කල්පිත ආර්ථිකයක, වියදම් ප්‍රවේශය මත දළ දේශීය නිෂ්පාදිතයෙහි ඇතුළත් සංරචකයන්ගේ නාමික අගයන් පහත වගුවෙහි දැක්වේ. (සියලු ම දත්ත රුපියල් බිලියනවලිනි.)

| වර්ෂය | C | I | G | X | M |
|---|---|---|---|---|---|
| 2017 | 600 | 200 | 100 | 250 | 150 |
| 2018 | 650 | 300 | 150 | 300 | 250 |

මෙම ආර්ථිකයේ දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය 2017 දී 100ක සිට 2018 දී 110ක් දක්වා වැඩි වූයේ යැයි උපකල්පනය කරන්න. 2018 දී, මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන අනුපාතිකය කොපමණ ද?
(1) 5% (2) 10% (3) 12% (4) 15% (5) 16% (……)

**22.** දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී අතරමැදි භාණ්ඩ වටිනාකම ඇතුළත් **නොකෙරෙනුයේ**
(1) ඒවා පවත්නා වර්ෂයේ දී පරිභෝජනය කෙරෙන බැවිනි.
(2) ආර්ථිකය තුළ නිෂ්පාදනය කරනු ලබන සියලු ම අතරමැදි භාණ්ඩ පිළිබඳව වාර්තා තබා ගැනීම අතිශයින් ම දුෂ්කර කටයුත්තක් වන බැවිනි.
(3) ඒවා භාණ්ඩ වෙළෙඳපොළවල පමණක් අලෙවි කෙරෙන බැවිනි.
(4) සමාජ ශුභසාධනය අඩු කෙරෙන භාණ්ඩ ඇතුළත් වීම වළක්වාලනු පිණිස ය.
(5) ඒවායේ වටිනාකම දෙවරක් ගණනය වීම සහ එමගින් දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම අධිතක්සේරු වීම වළක්වා ගැනීම පිණිස ය. (……)

**23.** රජය තම වියදම් රුපියල් බිලියන 600කින් වැඩි කොට එම වියදම් පියවා ගැනීම සඳහා රුපියල් බිලියන 600කින් බදු ඉහළ නැංවුවහොත්, අයවැය ලේඛනය සහ දළ දේශීය නිෂ්පාදිතය කෙරෙහි එමගින් ඇති වන බලපෑම නිවැරදිව පැහැදිලි කෙරෙනුයේ පහත දැක්වෙන කවර සංයෝජනයකින් ද?

| | අය-වැය ලේඛනය | දළ දේශීය නිෂ්පාදිතය |
|---|---|---|
| (1) | වෙනස් නොවේ | අඩු වේ |
| (2) | අතිරික්තයකි | අඩු වේ |
| (3) | වෙනස් නොවේ | වෙනස් නොවේ |
| (4) | අතිරික්තයකි | වැඩි වේ |
| (5) | වෙනස් නොවේ | වැඩි වේ |

(……)

**24.** පහත දැක්වෙන වගුවෙහි ඉදිරිපත් කොට ඇති දත්ත කිසියම් ආර්ථිකයක වැය කළ හැකි දළ ජාතික ආදායම සහ සමාහාර පරිභෝජන වියදම අතර සම්බන්ධය විස්තර කරයි.

| වැය කළ හැකි දළ ජාතික ආදායම (රුපියල් බිලියන) | සමාහාර පරිභෝජන වියදම (රුපියල් බිලියන) |
|---|---|
| 800 | 700 |
| 860 | 745 |
| 920 | 790 |
| 980 | 835 |

මෙම ආර්ථිකයේ ආන්තික පරිභෝජන නැම්යාවේ අගය සම්බන්ධයෙන් නිගමනය කළ හැක්කේ කවරක් ද?
(1) වැය කළ හැකි දළ ජාතික ආදායම වැඩි වන විට එය ද වැඩි වේ.
(2) වැය කළ හැකි දළ ජාතික ආදායම වැඩි වන විට එය අඩු වේ.
(3) ආන්තික පරිභෝජන නැම්යාවේ අගය 0.87කි.
(4) ආන්තික පරිභෝජන නැම්යාවේ අගය 0.45කි.
(5) ආන්තික පරිභෝජන නැම්යාවේ අගය 0.75කි. (……)



Department of Examinations Sri Lanka

25. එක්තරා ආර්ථිකයක් වර්තමානයේ රුපියල් බිලියන 5 000ක සමතුලිත නිමැවුම් මට්ටමක් නිෂ්පාදනය කරමින් සිටින බවත් ආන්තික පරිභෝජන නැඹියාව 0.8ක් බවත් උපකල්පනය කරන්න. මෙම ආර්ථිකයේ පූර්ණ සේවා නියුක්ති සමතුලිත නිමැවුම් මට්ටම රුපියල් බිලියන 7 000 ක් වේ නම් එය අත්කර ගැනීමෙහි ලා පහත සඳහන් කවර ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයක් සමත් වේ ද?
(1) රුපියල් බිලියන 2 000 කින් බදු අඩු කිරීම
(2) රුපියල් බිලියන 2 000 කින් රජයේ වියදම් වැඩි කිරීම
(3) රුපියල් බිලියන 500 කින් රජයේ වියදම් වැඩි කිරීම
(4) රුපියල් බිලියන 500 කින් බදු අඩු කිරීම
(5) රුපියල් බිලියන 400 කින් බදු අඩු කිරීම (……)

26. රජයේ කටයුතු නොමැති ආවෘත ආර්ථිකයක සමාහාර ඉතුරුම් ශ්‍රිතය $S = -100 + 0.2Y$ක් බවත්, සමතුලිත ජාතික ආදායම් මට්ටම රුපියල් බිලියන 2 000ක් බවත් සලකන්න. මෙම ආර්ථිකයේ ආයෝජන මට්ටම කොපමණ ද?
(1) රුපියල් බිලියන 100 (2) රුපියල් බිලියන 200
(3) රුපියල් බිලියන 300 (4) රුපියල් බිලියන 400
(5) රුපියල් බිලියන 500 (……)

27. කල්පිත ආර්ථිකයක සාර්ව ආර්ථික දත්ත සමහරක් පහත දැක්වෙන වගුව පෙන්නුම් කරයි. (සියලු ම අගයන් රුපියල් බිලියනවලිනි.)

| ආණ්ඩුවේ මිල දී ගැනීම් (G) | ආනයන (M) | බදු (T) | ආයෝජනය (I) | අපනයන (X) | ඉතුරුම් (S) |
|---|---|---|---|---|---|
| 30 | 70 | 40 | 50 | 80 | 60 |

මෙම ආර්ථිකය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශනයක් නිවැරදි වේ ද?
(1) ආනයනවලට වඩා අපනයන විශාල බැවින් ආර්ථිකය ප්‍රසාරණය වේ.
(2) බදුවලට වඩා ඉතුරුම් විශාල බැවින් ආර්ථිකය සංකෝචනය වේ.
(3) කාන්දුවීම්වලට වඩා විදීම් විශාල බැවින් ආර්ථිකය ප්‍රසාරණය වේ.
(4) කාන්දුවීම් විදීම්වලට වඩා විශාල බැවින් ආර්ථිකය සංකෝචනය වේ.
(5) විදීම් කාන්දුවීම්වලට සමාන බැවින් ආර්ථිකය සමතුලිත වේ. (……)

28. පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමනයක් ආරම්භ විය හැක්කේ
(1) මුදල් වැටුප් අනුපාතිකය ඉහළ යාමකිනි. (2) ආණ්ඩුවේ මිල දී ගැනීම් ඉහළ යාමකිනි.
(3) මුදල් ප්‍රමාණයෙහි වැඩිවීමකිනි. (4) මුදල් ආදායමේ ඉහළ යාමකිනි.
(5) බදු අනුපාතික අඩුවීමකිනි. (……)

29. කිසියම් කල්පිත ආර්ථිකයක නාමික දළ දේශීය නිෂ්පාදිතය රුපියල් ට්‍රිලියන 8ක් සහ මුදල් සැපයුම රුපියල් ට්‍රිලියන 2ක් වේ නම් මුදලේ සංසරණ ප්‍රවේගය
(1) 0.25කි. (2) 2කි. (3) 4කි. (4) 6කි. (5) 8කි. (……)

30. මුදල් ගුණකය යනු
(1) බැංකු තැන්පතු ප්‍රමාණය බැංකු සංචිත ප්‍රමාණයෙන් බෙදූ විට ලැබෙන අනුපාතයයි.
(2) බැංකු තැන්පතු ප්‍රමාණය අධි බල මුදල් ප්‍රමාණයෙන් බෙදූ විට ලැබෙන අනුපාතයයි.
(3) බැංකු තැන්පතු ප්‍රමාණය අධි සංචිත ප්‍රමාණයෙන් බෙදූ විට ලැබෙන අනුපාතයයි.
(4) මුදල් සැපයුම අධි බල මුදල් ප්‍රමාණයෙන් බෙදූ විට ලැබෙන අනුපාතයයි.
(5) ව්‍යවහාර මුදල් ප්‍රමාණය බැංකු සංචිත ප්‍රමාණයෙන් බෙදූ විට ලැබෙන අනුපාතයයි. (……)

31. මහ බැංකුවට මුදල් සැපයුම වැඩි කළ හැක්කේ
(1) වාණිජ බැංකුවලට තමන් සතු රත්රන් සංචිත අලෙවි කිරීමෙනි.
(2) තමන් සතු විදේශ ව්‍යවහාර මුදල් අලෙවි කිරීමෙනි.
(3) විවෘත වෙළෙඳපොළෙන් සුරැකුම්පත් මිල දී ගැනීමෙනි.
(4) විදේශීය මහ බැංකු වෙතින් රත්රන් මිල දී ගැනීමෙනි.
(5) විදේශ ආණ්ඩු වෙතින් සංචිත ණයට ගැනීමෙනි. (……)

32. විවට වෙළෙඳපොළ කටයුතු යනු
(1) කොළඹ කොටස් වෙළෙඳපොළෙහි කොටස් මිල දී ගැනීම හා අලෙවි කිරීම ය.
(2) මහ බැංකුව විසින් වාණිජ බැංකු වෙත ණය ලබා දීම ය.
(3) මහ බැංකුව විසින් රජයේ සුරැකුම්පත් මිල දී ගැනීම හා අලෙවි කිරීම ය.
(4) රජය විදේශ බැඳුම්කර මිලට ගැනීම ය.
(5) අපනයන ප්‍රවර්ධනය සඳහා රජය සහනාධාර ප්‍රදානය කිරීම ය. (……)

[හයවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**33.** ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 15% ක් බවත්, වාණිජ බැංකුවක් රුපියල් 2 000ක නව තැන්පතුවක් බාරගන්නා බවත් උපකල්පනය කරන්න. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවේ ශේෂ පත්‍රයෙහි පහත සඳහන් කවර වෙනසක් සිදු වේ ද?

| | වගකීම් | අවශ්‍ය කරන සංචිතය |
|---|---|---|
| (1) | රුපියල් 2 000කින් වැඩි වේ | රුපියල් 1 700කින් වැඩි වේ |
| (2) | රුපියල් 2 000කින් වැඩි වේ | රුපියල් 300කින් වැඩි වේ |
| (3) | රුපියල් 2 000කින් වැඩි වේ | වෙනස් නොවේ |
| (4) | රුපියල් 2 000කින් අඩු වේ | රුපියල් 300කින් අඩු වේ |
| (5) | රුපියල් 2 000කින් වැඩි වේ | රුපියල් 1 700කින් අඩු වේ |

(……)

**34.** පොදු භාණ්ඩයක් යනු

(1) පොදු මහජනතාව විසින් මුදල් ගෙවා ලබා ගත යුතු භාණ්ඩයකි.


(2) පරිභෝජනයේ දී තරගකාරිත්වයක් නොමැති භාණ්ඩයකි.


(3) පෞද්ගලික භාණ්ඩයකට වඩා මිල අධික භාණ්ඩයකි.

(4) ධන බාහිරතා ජනනය කෙරෙන භාණ්ඩයකි.

(5) සෘණ බාහිරතා ජනනය කෙරෙන භාණ්ඩයකි. (……)

**35.** පහත සඳහන් රූපසටහන් A හා B යන භාණ්ඩ සඳහා පවතින තරගකාරී වෙළෙඳපොළ දෙකක් නිරූපණය කරයි. එහි MSC මගින් සමාජයීය ආන්තික පිරිවැයත් MPC මගින් පෞද්ගලික ආන්තික පිරිවැයත් දැක්වේ.




මෙම රූපසටහන් දෙක පදනම් කර ගනිමින් එළැඹිය හැකි නිවැරදි නිගමනය වන්නේ

(1) රූපසටහන් දෙකම බාහිරතා පවතින බව පෙන්නුම් කරයි.

(2) රූපසටහන් දෙකම සෘණ බාහිරතා පවතින බව පෙන්නුම් කරයි.

(3) රූපසටහන් දෙකම ධන බාහිරතා පවතින බව පෙන්නුම් කරයි.

(4) ඌන නිෂ්පාදනයක් නිසා හටගන්නා අකාර්යක්ෂමතාව A රූපසටහන පෙන්නුම් කරයි.

(5) අධි නිෂ්පාදනයක් නිසා හටගන්නා අකාර්යක්ෂමතාව B රූපසටහන පෙන්නුම් කරයි. (……)

**36.** 'ආණ්ඩුව අසමත් වීම' හටගනුයේ

(1) වෙළෙඳපොළක සමාජ ප්‍රතිලාභ ඉක්මවා සමාජ පිරිවැය හටගන්නා විට ය.

(2) වෙළෙඳපොළට මැදිහත් වීමට ආණ්ඩුව අසමත් වන විට ය.

(3) වෙළෙඳපොළෙහි බාහිරතා පවතින විට ය.

(4) නිදහස් වෙළෙඳපොළ විසඳුම සමග සැසඳීමේ දී රජයේ මැදිහත් වීම ශුභසාධනයේ ශුද්ධ අහිමිවීමක් ඇති කරන විට දී ය.

(5) නිෂ්පාදන අකාර්යක්ෂමතාව සහ සම්පත් බෙදා වෙන් කිරීමේ අකාර්යක්ෂමතාව ඉවත් කිරීමට ආණ්ඩුව අසමත් වන විට දී ය. (……)

**37.** අනුක්‍රමික ආදායම් බදු අනුපාතික ව්‍යුහයක් ක්‍රියාත්මක වන විට දී ධනවත් අය බදු වශයෙන් ගෙවන්නේ

(1) තම ආදායමින් දිළිඳු අයට වඩා අඩු ප්‍රතිශතයක් ය.

(2) දිළිඳු අයට වඩා අඩු රුපියල් ප්‍රමාණයක් ය.

(3) ආදායම් මට්ටම කුමක් වුව ද තම ආදායමින් ස්ථාවර ප්‍රතිශතයක් ය.

(4) ආදායම වැඩි වන විට ආදායමින් ක්‍රමයෙන් වැඩි වන ප්‍රතිශතයක් ය.

(5) ආදායම වැඩි වන විට ආදායමින් ක්‍රමයෙන් අඩු වන ප්‍රතිශතයක් ය. (……)

[ හත්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**38.** 2017 සහ 2018 යන වර්ෂවල ශ්‍රී ලංකා මධ්‍යම රජයේ නොපියවා ඇති මුළු ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් කොපමණ ද?

| | 2017 | 2018 |
|---|---|---|
| (1) | 76.9 | 82.9 |
| (2) | 79.1 | 80.2 |
| (3) | 80.0 | 90.0 |
| (4) | 74.5 | 85.0 |
| (5) | 78.5 | 79.5 |

(......)

**39.** ඉතා මෑතක දී ශ්‍රී ලංකාව සමග නිදහස් වෙළෙඳ ගිවිසුමකට එළැඹුනේ පහත දැක්වෙන කවර රටක් ද?
(1) ඉන්දියාව (2) චීනය (3) බංග්ලාදේශය
(4) සිංගප්පූරුව (5) පාකිස්ථානය (......)

**40.** එක්තරා රටක භාණ්ඩ වෙළෙඳ අනුපාත දර්ශකයට අදාළ දත්ත පහත වගුවේ දැක්වේ.

| වර්ෂය | භාණ්ඩ වෙළෙඳ අනුපාත දර්ශකය |
|---|---|
| 2014 | 100 |
| 2016 | 110 |
| 2018 | 134 |

ඉහත වගුවේ දක්වා ඇති දත්තවලට අනුව 2014 - 2018 කාලය සඳහා නිගමනය කළ හැක්කේ
(1) ආනයන මිලට සාපේක්ෂව අපනයන මිල වඩා වේගයෙන් ඉහළ ගිය බව ය.
(2) අපනයන මිලට සාපේක්ෂව ආනයන මිල ඉහළ ගිය බව ය.
(3) ආනයන පරිමාව ඉක්මවා අපනයන පරිමාව ඉහළ ගිය බව ය.
(4) ආනයන පරිමාව වැඩි වූවාට වඩා වේගයෙන් අපනයන පරිමාව වැඩි වූ බව ය.
(5) වෙළෙඳ ශේෂයේ අතිරික්තය ඉහළ ගිය බව ය. (......)

**41.** සංවර්ධනය වන රටක ජල විදුලි බලය ජනනය කිරීම සඳහා ජලාශයක් ඉදි කිරීමට කැනඩාව මූල්‍ය ආධාරයක් ලබා දෙන්නේ යැයි සලකන්න. මෙය කැනඩාවේ ගෙවුම් ශේෂ ලේඛනයෙහි වාර්තා කෙරෙනුයේ
(1) ප්‍රාග්ධන ගිණුමේ හර අයිතමයක් වශයෙනි.
(2) මූල්‍ය ගිණුමේ හර අයිතමයක් වශයෙනි.
(3) සේවා ගිණුමෙහි හර අයිතමයක් වශයෙනි.
(4) ප්‍රාථමික ආදායම් ගිණුමේ බැර අයිතමයක් වශයෙනි.
(5) ද්විතීයික ආදායම් ගිණුමේ බැර අයිතමයක් වශයෙනි. (......)

**42.** කිසියම් රටක ව්‍යවහාර මුදල ක්ෂයවීමේ ප්‍රතිඵලයක් විය හැක්කේ
(1) උද්ධමන අනුපාතිකය ඉහළ යාම ය.
(2) අපනයනවල ලාභ ආන්තික අඩු වීම ය.
(3) විරැකියාව ඉහළ යාම ය.
(4) වෙළෙඳ අනුපාතය වැඩි දියුණු වීම ය.
(5) විදේශ ප්‍රාග්ධන අරමුදල් රට තුළට ගලාඒම ඉහළ යාම ය. (......)

**43.** ස්ථාවර විනිමය අනුපාතිකයක් පවතින රටක එම රටේ වෙළෙඳ පාර්ශ්වකරුවන්ට සාපේක්ෂව උද්ධමන අනුපාතිකය ඉහළ යති යි සලකන්න. එහි ප්‍රතිඵලයක් වශයෙන් ආනයන හා අපනයන මත බොහෝ දුරට හටගත හැකි වෙනස්කම් කවරේ ද?

| | ආනයන | අපනයන |
|---|---|---|
| (1) | අඩු වේ | අඩු වේ |
| (2) | අඩු වේ | වැඩිවේ |
| (3) | වැඩි වේ | අඩු වේ |
| (4) | වැඩි වේ | වැඩි වේ |
| (5) | වෙනස් නොවේ | වෙනස් නොවේ |

(......)

[අටවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

**44.** මානව සංවර්ධන දර්ශකය (HDI) විසින් සමාජයීය කාර්යසාධනයට අදාළ පුළුල් ක්ෂේත්‍රයක් තනි සංයුක්ත දර්ශකයකට කැටිකොට දක්වනු ලබන්නේ
(1) විෂමතා අඩු කිරීමේ අනුපාතිකය, මානව සම්පත් සංවර්ධන අනුපාතිකය සහ සාක්ෂරතා අනුපාතිකය යන කරුණු ඒකාබද්ධ කරමිනි.
(2) දීර්ඝායුෂ, අධ්‍යාපනය සහ ජීවන තත්ත්වය යන කරුණු ඒකාබද්ධ කරමිනි.
(3) අවම පාසල් අධ්‍යාපනය, වැඩිහිටි සාක්ෂරතාව සහ තෘතීය අධ්‍යාපනය අත්කර ගැනීම යන කරුණු ඒකාබද්ධ කරමිනි.
(4) මානව සම්පත් පුහුණු කිරීම, සංවර්ධනය සහ නව්‍යතා යන කරුණු ඒකාබද්ධ කරමිනි.
(5) ළදරු මර්ත්‍යතාව, වැඩිහිටි සාක්ෂරතාව සහ ප්‍රතිශීර්ෂ ආදායම යන කරුණු ඒකාබද්ධ කරමිනි. (......)

**45.** පහළ මැදි ආදායම් රටවල් සඳහා වන ජාත්‍යන්තර දරිද්‍රතා රේඛාව වනුයේ
(1) එක්සත් ජනපද ඩොලර් 1.25ය.
(2) එක්සත් ජනපද ඩොලර් 1.90ය.
(3) එක්සත් ජනපද ඩොලර් 3.20ය.
(4) එක්සත් ජනපද ඩොලර් 5.50ය.
(5) එක්සත් ජනපද ඩොලර් 21.70ය. (......)

**46.** 2016 වර්ෂයේ ජනගහන දරිද්‍රතා අනුපාතිකය අනුව, ශ්‍රී ලංකාවේ අඩුම දරිද්‍රතාව සහ වැඩිම දරිද්‍රතාව සහිත දිස්ත්‍රික්ක වනුයේ පිළිවෙළින්
(1) ගම්පහ සහ මුලතිව් ය.
(2) කොළඹ සහ කිළිනොච්චිය ය.
(3) ගම්පහ සහ මඩකලපුව ය.
(4) කොළඹ සහ ත්‍රිකුණාමලය ය.
(5) හම්බන්තොට සහ වවුනියාව ය. (......)

**47.** සමාජයේ ධනවත්ම 10% වෙතින් දිළිඳුතම 10% කරා ආදායම් පුනර්ව්‍යාප්තියක් කරනු ලැබුවහොත්
(1) ජිනි සංගුණකය ඉහළ යන අතර ලෝරන්ස් වක්‍රය 45° රේඛාවට ආසන්න වනු ඇත.
(2) ජිනි සංගුණකය පහළ යන අතර ලෝරන්ස් වක්‍රය 45° රේඛාවට ආසන්න වනු ඇත.
(3) ජිනි සංගුණකය පහළ යන අතර ලෝරන්ස් වක්‍රය 45° රේඛාව වෙතින් දුරස් වනු ඇත.
(4) ජිනි සංගුණකය ඉහළ යන අතර ලෝරන්ස් වක්‍රය 45° රේඛාව වෙතින් දුරස් වනු ඇත.
(5) ජිනි සංගුණකය ඉහළ යන අතර ලෝරන්ස් වක්‍රය 45° රේඛාව මත පිහිටයි. (......)

**48.** කිසියම් කල්පිත ආර්ථිකයක ශ්‍රම වෙළෙඳපොළ දත්ත පහත වගුවෙහි දැක්වේ.

| වර්ෂය | සේවා නියුක්ත ජනගහනය (මිලියන) | ශ්‍රම හමුදාව (මිලියන) | වයස අවුරුදු 15 හා ඊට වැඩි කුටුම්බ ජනගහනය (මිලියන) |
|---|---|---|---|
| 2017 | 27 | 30 | 60 |
| 2018 | 32 | 36 | 80 |

ඉහත දත්ත පදනම් කර ගනිමින් පහත සඳහන් කවර ප්‍රකාශනයක් නිවැරදි වේ ද?
(1) ශ්‍රම හමුදා සහභාගිත්ව අනුපාතිකය 2017 වර්ෂයට වඩා 2018 වර්ෂයේ දී පහළ අගයක් විය.
(2) 2018 වර්ෂයේ විරැකියා අනුපාතිකය 2017 වර්ෂයට වඩා පහළ අගයක් විය.
(3) ශ්‍රම හමුදා සහභාගිත්ව අනුපාතිකය 2017 වර්ෂයට වඩා 2018 වර්ෂයේ දී ඉහළ අගයක් විය.
(4) 2018 වර්ෂයේ ශ්‍රම හමුදා සහභාගිත්ව අනුපාතිකය 2017 වර්ෂයේ අගයට හරියට ම සමාන විය.
(5) 2018 වර්ෂයේ විරැකියා අනුපාතිකය 2017 වර්ෂයේ අගයට හරියට ම සමාන විය. (......)

**49.** ශ්‍රී ලංකාවේ මුළු යැපුම් අනුපාතය නිර්වචනය කරනුයේ,
(1) වයස අවුරුදු 65ට වඩා වැඩි ජනගහන ප්‍රතිශතය ලෙසට ය.
(2) ළමයින් සංඛ්‍යාව වැඩිහිටි ජනගහනයේ අනුපාතයක් වශයෙනි.
(3) වයස අවුරුදු 10ට වඩා අඩු සහ අවුරුදු 60ට වඩා වැඩි ජනගහන ප්‍රතිශතය වශයෙනි.
(4) වයස අවුරුදු 15ට වඩා අඩු සහ අවුරුදු 64ට වඩා වැඩි ජනගහන ප්‍රතිශතය වශයෙනි.
(5) වැඩ නොකරන වයසේ ජනගහනය වැඩ කරන වයසේ ජනගහනයේ ප්‍රතිශතයක් වශයෙනි. (......)

**50.** 2016 කුටුම්බ ආදායම් - වියදම් සමීක්ෂණයට අනුව, ශ්‍රී ලංකාවේ ධනවත්ම කුටුම්බ 20% සහ දිළිඳුතම කුටුම්බ 20% හිමිකර ගත් ආදායම් පංගු පිළිවෙළින්
(1) 50.8% සහ 4.8% වේ.
(2) 45.1% සහ 4.5% වේ.
(3) 54.1% සහ 6.1% වේ.
(4) 62.3% සහ 3.2% වේ.
(5) 53.3% සහ 5.6% වේ. (......)

* * *

Department of Examinations Sri Lanka

(iv) ගුණක ප්‍රතිවිපාකය යනු කුමක් ද? රජයේ මිල දී ගැනීම් අඩු වීමක ගුණක ප්‍රතිවිපාකය 45° රේඛාව ඇතුළත් රූපසටහනක් යොදාගනිමින් පෙන්නුම් කරන්න. (ලකුණු 04යි)

(v) බදු වෙනස් වූවාට වඩා රජයේ මිල දී ගැනීම් වෙනස් වූ විට මූර්ත දළ දේශීය නිෂ්පාදිතය වැඩි ප්‍රමාණයකින් වෙනස් වන්නේ ඇයි? (ලකුණු 04යි)

**'ආ' උප කොටස**

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරාගන්න.)

**6.** (i) විනිමය සමීකරණය සඳහන් කොට එහි එක් එක් විචල්‍යය හඳුන්වන්න. (ලකුණු 04යි)

(ii) "අධි ඉල්ලුම නිසා උද්ධමනය ආරම්භ වන නමුත් එය අඛණ්ඩව පවත්වාගනුයේ පිරිවැය ඉහළ යාමෙනි." රූපසටහන් යොදා ගනිමින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) සඵල හුවමාරු මාධ්‍යයක් ලෙස ක්‍රියා කිරීමට මුදල් විසින් සපුරාලිය යුතු නිර්ණායක කවරේ ද? (ලකුණු 04යි)

(iv) ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය සමන්විත වී ඇති ප්‍රධාන ආයතන **හතරක්** නම් කරන්න. (ලකුණු 04යි)

(v) $M_{2b}$ සහ $M_4$ යන මූල්‍ය සමාහාර සමන්විත වන සංරචක හඳුන්වන්න. (ලකුණු 04යි)

**7.** (i) ධන බාහිරතා සහ සෘණ බාහිරතා පවතින විට, සමතුලිත නිමැවුම් මට්ටම සහ සමාජයීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම් මට්ටම අතර කෙබඳු වෙනස්කම් දක්නට ලැබේ ද? රූපසටහන් යොදා ගනිමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) අර්ධ පොදු භාණ්ඩ සහ ශුභසාධන භාණ්ඩවල කැපීපෙනෙන ලක්ෂණ උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) ශ්‍රී ලංකා රජයේ පුනරාවර්තන වියදමෙහි ප්‍රධාන සංරචක නම් කරන්න. (ලකුණු 04යි)

(iv) 'අධි බදු බර' යන්නෙන් කවරක් අදහස් වේ ද? ඉල්ලුමේ මිල අනම්‍යතාවක් පවතින භාණ්ඩයක් මත පනවනු ලබන නිෂ්පාදන බද්දක අධි බදු බර රූපසටහනක් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(v) පසුගිය වසර තුන තුළ ශ්‍රී ලංකාව අය-වැය හිඟය මූල්‍යනය කිරීම සඳහා පුළුල් වශයෙන් යොදාගනු ලැබූ මූලාශ්‍ර සහ උපකරණ නම් කරන්න. (ලකුණු 04යි)

**8.** (i) A නම් රටට තමන්ගේ සියලුම සම්පත් භාවිතයට ගත් විට X භාණ්ඩයෙන් ඒකක 80ක් හෝ Y භාණ්ඩයෙන් ඒකක 60ක් හෝ නිපදවිය හැකි ය. B නම් රටට ඒ අන්දමින් X භාණ්ඩයෙන් ඒකක 60ක් හෝ Y භාණ්ඩයෙන් ඒකක 60ක් හෝ නිපදවිය හැකි යැයි සිතන්න.

(අ) ස්ථාවර පිරිවැය තත්ත්වයක් පවතී යැයි උපකල්පනය කොට සාපේක්ෂ පිරිවැය වාසි මත එක් එක් රට විශේෂීකරණය කළ යුත්තේ කවර භාණ්ඩයක් දැයි දක්වන්න. (ලකුණු 02යි)

(ආ) අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක වෙළෙඳාමක් හට ගැනීම සඳහා X භාණ්ඩය සහ Y භාණ්ඩය අතර හුවමාරු අනුපාතය කවර සීමාවන් තුළ තිබිය යුතු ද? (ලකුණු 02යි)

(ii) ශ්‍රී ලංකාව විසින් අත්සන් කොට ඇති (ratified) නිදහස් වෙළෙඳ ගිවිසුම් **හතරක්** නම් කරන්න. (ලකුණු 04යි)

(iii) පසුගිය වසර පහ තුළ ශ්‍රී ලංකාවේ වෙළෙඳ හිඟය විශාල වශයෙන් පුළුල් වීමට බලපා ඇති හේතු කවරේ ද? (ලකුණු 04යි)

(iv) කල්පිත ආර්ථිකයක ගෙවුම් ශේෂ ලේඛනයක සංරචක පහත සඳහන් වගුව පෙන්නුම් කරයි.

| ගෙවුම් ශේෂයේ සංරචක | රුපියල් බිලියන |
|---|---|
| වෙළෙඳ ශේෂය | – 960 |
| සේවා (ශුද්ධ) | 340 |
| ප්‍රාථමික ආදායම (ශුද්ධ) | – 230 |
| ද්විතීය ආදායම (ශුද්ධ) | 630 |
| ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ) | 20 |

(අ) ජංගම ගිණුමේ ශේෂය කොපමණ ද? (ලකුණු 02යි)

(ආ) මූල්‍ය ගිණුමේ ශේෂය කොපමණ ද? (ලකුණු 02යි)

(v) පාලිත නම්‍ය විනිමය අනුපාතික ක්‍රමය කරා රටවල් යොමු කර වීමට බලපෑ නිදහසේ උච්චාවචනය වන විනිමය අනුපාතිකයන්ගේ අවාසි කවරේ ද? (ලකුණු 04යි)

[හතරවැනි පිටුව බලන්න

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

**9.** (i) 'ඵලදායීතාව' යන සංකල්පයෙන් කවරක් අදහස් වේ ද? ඵලදායීතාව තීරණය කෙරෙන ප්‍රධාන සාධක කවරේ ද? (ලකුණු 05යි)

(ii) "ජීවිතයේ ගුණාත්මක තත්ත්වය මිනුම් කිරීම සඳහා ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායමේ (GNI) වෘද්ධිය ප්‍රමාණවත් මිනුමක් නොවේ." පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iii) මානව සංවර්ධන දර්ශකය යනු කුමක් ද? සංවර්ධනය පිළිබඳ අවශේෂ මිනුම් සමග බලන විට මානව සංවර්ධන දර්ශකයේ වාසි හා අවාසි කවරේ ද? (ලකුණු 05යි)

(iv) ශ්‍රී ලංකාවේ අන්ත දරිද්‍රතාව කෙරෙහි බලපානු ලබන හේතු කවරේ ද? (ලකුණු 05යි)

**10.** (i) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රතිපත්ති දේශපාලන රෙජිමයන්ගේ වෙනස්වීම් සමගම වෙනස් වී ඇති ආකාරය සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 05යි)

(ii) "අතිශයින්ම අත්‍යවශ්‍ය වූ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ කල් දැමීම නිසා වර්තමානයේ ශ්‍රී ලංකා ආර්ථිකය ඉතා පහත් වෘද්ධි මාවතකට ඇද වැටී තිබේ." ශ්‍රී ලංකාව විසින් ක්‍රියාවට නැංවීම ප්‍රමාද කොට ඇති මෙම වෘද්ධි-ප්‍රවර්ධන ප්‍රතිසංස්කරණ කවරේ ද? (ලකුණු 05යි)

(iii) ශ්‍රී ලංකාවේ ආයෝජනය කෙරෙහි බාධක වශයෙන් පවත්නා ආයෝජන පරිසරයෙහි සහ සාධක වෙළෙඳපොළෙහි දුබලතා සඳහන් කරන්න. (ලකුණු 05යි)

(iv) "ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය ප්‍රමාණය ඉතා ඉහළ අගයක පවතින අතර ම ණය කලඹෙහි ස්වභාවය ද ණයෙහි තිරසාරභාවය පිළිබඳ සැලකිය යුතු අවදානමක් පෙන්නුම් කරයි." විශේෂයෙන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණයෙහි ප්‍රමාණය සහ එහි සංයුතිය කෙරෙහි අවධානය යොමු කරමින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

* * *

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka